සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

මගේ අංකය
எனது இல DDD/HO/07/SD/05/01/SK
My No

ඔබේ අංකය
உமது இல ……………………………………
Your No

දිනය
திகதி 2017.05.02
Date

සියලුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2017**

සමෘද්ධි කැකුළු ළමා සමාජ ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධව ඔබ වෙත යොමුකරන ලද මාගේ සමාංක දරණ 2017.03.31 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව සියලුම දිස්ත්‍රික් ආවරණය කරමින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය 2017 වසරේ ද පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. දිවයින පුරා සමෘද්ධි කැකුළු ළමා සමාජ තුළ ඒකරාශි වූ දරුවන් ලක්ෂ 10 කට පමණ විවිධ තරඟ ඉසව් ඔස්සේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන් වර්ධනය කර ගැනීමට මෙයින් මහඟු පිටිවහලක් ලැබෙන බව නොකිවමනාය. 2004 වසරේ සිට 2016 වසර දක්වා මෙම ජාතික තරඟාවලිය සිංහල හා දමිළ මාධ්‍යයෙන් වයස් කාණ්ඩ 03 කින් සාර්ථකව පැවැත්වීම සඳහා ඔබ හා ඔබගේ කාර්ය මණ්ඩලය දැක්වූ සහයෝගය ස්තූති පූර්වක ගෞරවයෙන් සිහිපත් කරමි.

03. "සමෘද්ධි කැකුළු ළමා සමාජ සාහිත්‍ය හා සංස්කෘතික තරඟාවලිය" බැංකු සංගම්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වයස් කාණ්ඩ 3 ක් යටතේ 2017 වසරේදී ද පැවැත්වීමට තීරණය කර ඇත. දැනට ප්‍රතිසංවිධානය කර ඇති සහ අළුතින් ආරම්භ කළ සමෘද්ධි ළමා සමාජ තුළ සංවේදී, නිර්මාණශීලී කුසලතාවලින් පිරිපුන්, නැණවත්, ගුණවත් දරු පරපුරක් බිහි කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

04. මෙවර ද සමෘද්ධි සංවර්ධන වැඩසටහන, ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය උසස්ව පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අධ්‍යාත්මික සංවර්ධනය තුළින් ආර්ථික සංවර්ධනය ජය ගැනීමට ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත් හා දුම්වැටි භාවිතයට විරුද්ධ මතයක් ගොඩ නඟමින් මත් හා දුම්වැටි භාවිතය ජන ජීවිතයට කොතරම් බලපෑම් කරනවාද යන්න තේමාව කර ගනිමින් බැංකු සංගම්හි,

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail-dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
Hot Line : 0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
Hot Line: 011- 2887722

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ පැවැත්වෙන ස්ථානයන්හි සන්නිවේදනය කළ යුතු පණිවිඩ රැගත් බැනර් ප්‍රදර්ශනය කළ යුතු වේ. මේ බැනර් සඳහා ආකෘති 04 ක් ඇමුණුම අංක 07හි සඳහන් වේ. ආකෘති 04 ම මුද්‍රණය කර ප්‍රදර්ශනය කිරීම වඩාත් යෝග්‍ය වේ. එක් බැනරයක් අඩි 06 ක් දිග සහ පළල අඩි 03 ක් විය යුතුය. එක් බැනරයක් සඳහා උපරිමව වියදම් කළ හැක්කේ රු.1,000/- කි. සමෘද්ධි වැඩසටහනට නව ප්‍රචාරණයක් ලබා දීම සඳහා බැංකු සංගමයක් එක බැනරයක් හෝ ප්‍රදර්ශනය කළ යුතු වන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මේ සම්බන්ධව අධීක්ෂණය කළ යුතු වේ.

05. තරඟාවලිය පැවැත්වීම සම්බන්ධ තොරතුරු පහත සඳහන් වේ.

- ඇමුණුම අංක 01 - පොදු තරඟ කොන්දේසි (පිටු අංක 3-4)
- ඇමුණුම අංක 02 - තරඟ විස්තර(පිටු අංක 5)
- ඇමුණුම අංක 03 - සිංහල මාධ්‍ය තරඟ ඉසව්(පිටු අංක 6-8)
- ඇමුණුම අංක 04 - දමිළ මාධ්‍ය තරඟ ඉසව්(පිටු අංක 9-10)
- ඇමුණුම අංක 05 - කාල රාමුව / ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම (පිටු අංක 11-13)
- ඇමුණුම අංක 06 - ළමා කතන්දර ලකුණු සටහන් කිරීම (කලාප මට්ටමේ සිට) (පිටු අංක 14)
- ඇමුණුම අංක 07 - බැනර් සඳහා වැකි(පිටු අංක 15)

06. දීප ව්‍යාප්තව පැවැත්වෙන සමෘද්ධි කැකුළු ළමා සමාජ තරඟාවලියේ අනන්‍යතාවය රැකෙන පරිදි හා පොදු වටිනාකමක් ලබාදීමේ මූලික අරමුණින් එකම ආකෘතියකින් සහතික ලබා දිය යුතු යැයි තීරණය කර ඇත. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වන තරඟවලදී ජයග්‍රාහී දරුවන් සඳහා ලබා දීමට නියමිත සහතික ආකෘති දෙක සඳහා වන ග්‍රැෆික් සැලසුම් විද්‍යුත් තැපැල මඟින් ලබා ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

07. මෙම තරඟාවලිය සාර්ථකව පැවැත්වීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 1. ලේකම්, සමාජ සව්බල ගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු. අ. ක. ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - එම
4. සියලුම අධ්‍යක්ෂවරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - එම
5. සියලුම බැංකු කලාප භාර සමෘද්ධි කළමණාකරුවන් - එම

**ඇමුණුම 01**

**පොදු තරඟ කොන්දේසි**

I. මෙම තරඟාවලිය සිංහල හා දමිළ යන භාෂා ද්විත්වයෙන්ම පැවැත්විය යුතු අතර ඒ ඒ මාධ්‍යවල දරුවන් නියමිත මාධ්‍යයෙන් පමණක් තරඟ කළ යුතුය. දමිළ හෝ මුස්ලිම් දරුවෙක් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන්නේ නම් එම දරුවාට සිංහල මාධ්‍යයෙන් තරඟ කළ හැකිය. සිංහල මාධ්‍ය තරඟ ඉසව් 14 කින් හා දමිළ මාධ්‍ය තරඟ ඉසව් 10 කින් තරඟාවලිය සමන්විත වේ.

II. වයස් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ.

අවුරුදු 7 - 10 වයස් කාණ්ඩය - 2011.01.01 සිට හා 2007.12.31 දක්වා

අවුරුදු 11 - 14 වයස් කාණ්ඩය - 2007.12.30 සිට හා 2003.12.31 දක්වා

අවුරුදු 15 - 18 වයස් කාණ්ඩය - 2003.12.30 සිට හා 1999.12.31 දක්වා

III. කැකුළු ළමා සමාජ සාමාජික සාමාජිකාවන් පමණක් මෙම තරඟයට සහභාගි විය යුතු අතර සමෘද්ධි බැංකුවේ ගිණුමක් නොමැති කිසිම දරුවෙකු තරඟ සඳහා ඉදිරිපත් නොකළ යුතු බවට අවධාරණය කරමි. තරඟයේ මූලික අධියර බැංකු සංගම් මට්ටමින් ආරම්භ වීමට පෙර සමෘද්ධි බැංකුවල දරුවන් සඳහා ළමා ගිණුම් (කැකුළු / සිසුරක) ආරම්භ වී තිබිය යුතුය. නව ගිණුමක් නම් අවමය රු.500/- ක ශේෂයක් හා පැරණි ගිණුමක් නම්. රු.1,000/-ක අවම ශේෂයක්වත් තිබිය යුතුය. මෙහි මූලික අරමුණ වන්නේ දරුවන්ගේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම වේ.

IV. තරඟයෙන් තරඟයට බැංකු පොත්, උප්පැන්න සහතික ආදිය පරීක්ෂා කර බැංකු ගිණුම ආරම්භ කළ දිනය ඇතුළත්ව ලේඛනය සකස් කර කලාප මට්ටමේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස් කළ ලේඛනයද සහිතව ප්‍රාදේශීය ලේකම් වෙතත්, ප්‍රාදේශීය තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස් කළ ලේඛනය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙතත්, දිස්ත්‍රික් තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස් කළ නාම ලේඛනය නියමිත දිනට අධ්‍යක්ෂ ජනරාල් වෙතත් ලැබීමට සැලැස්විය යුතුය.

V. තරඟ ප්‍රතිඵල සඳහා කිසිදු ආකාරයකින් සමෘද්ධි දෙපාර්තමේන්තුවට සම්බන්ධ කිසිදු නිළධාරියෙකුගේ හෝ වෙනත් බාහිර පාර්ශවයක බලපෑම් සිදු නොවිය යුතුය. එවැනි සිදුවීම් සම්බන්ධ තොරතුරක් වාර්තා වූ වහාම ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ආසන්නම අධීක්ෂණ නිළධාරියාගේ වගකීම වන අතර ගැටළුකාරි තත්වයන් මතුවන තරඟාවලි සම්බන්ධ පැමිණිලි අනුව ඉදිරි අධියරයන් සඳහා සම්බන්ධවීමේ අවස්ථාව අහිමිවන බව ද දන්වමි.

VI. මීට පෙර වර්ෂ වලදී ජාතික මට්ටමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගත් තරඟකරුවෙකුට නැවත එම වයස් කාණ්ඩයෙන් එම තරඟයට තරඟ කිරීමට අවස්ථාව නොලැබෙන අතර එක් දරුවෙකුට තනි තරඟ ඉසව් දෙකකට සහභාගී විය නොහැකි අතර කණ්ඩායම් තරඟ සඳහා සීමාවක් නැත. හැකි තරම් දරුවන් වැඩි ප්‍රමාණයකට අවස්ථාව ලබාදීම සුදුසුය.

VII. කණ්ඩායම් තරඟ වලදී නර්තනය සඳහා දරුවන් 12 දෙනෙකු ගායනය සඳහා දරුවන් 4 දෙනෙකුට ද සහභාගි විය හැකිය. අවමය ගායනයද ඇතුලත්ව 10 කි. (වාදනය සඳහාද 4 දෙනෙකු සහභාගි විය හැකි අතර ඒ සඳහා ශිල්පීන් යොදා ගත හැකි වේ. වාදනය සඳහා වයස් සීමාවක් නොමැත. )

VIII. මුළු තරඟාවලිය පුරාවටම (කලාප ,ප්‍රාදේශීය,දිස්ත්‍රික්,ජාතික) නර්තනයේ යෙදීමට අවශ්‍ය වාදනය සැපයීම සඳහා  සීඩි තැටි / පෙන්ඩ්‍රයිව්, ජංගම දූරකථන පටිගත කිරීම් ආදිය භාවිතා කිරීම තහනම් වේ.

IX. කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික් තරඟයේදී විනිශ්චය මණ්ඩලය සඳහා තුන් දෙනෙක් සහභාගී කරවීම අනිවාර්ය වන අතර, නිළ වශයෙන් ප්‍රකාශයට පත්කරන තෙක් අදාළ නොවන කිසිම අයෙකුට ප්‍රතිඵල දැන ගැනීමට ඉඩ නොදිය යුතුය. තරඟයට පෙර අදාළ නීති රීති පිළිබඳ විනිශ්චය මණ්ඩලය ඇතුළු සියලු දෙනා දැනුවත් කළ යුතුය.

X. තරඟාවලිය පැවැත්වීමේදී ඉහත කී සුදුසුකම් නොමැති කිසිදු දරුවකු ඉදිරපත් නොකළ යුතු අතර ඒ සම්බන්ධව මෙන්ම තරඟාවලිය නිසි පරිදි පැවැත්වෙන බවට වගකීම ඒ ඒ අධියරයන්හිදී වගකීම පැවරී ඇති නළධාරින් දැරිය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

XI. තරඟ සඳහා ඉදිරිපත් වන දරුවන් තමන්ගේ ජාතික අනන්‍යතාවය පිළිබිඹු වන සේ සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුයි. (ජන නැටුම් හැර) (උදා:- සිංහල මාධ්‍ය ගැහැණු දරුවන් ළමා සාරියකින්, පිරිමි දරුවන් ජාතික ඇඳුමකින් හා දමිළ මාධ්‍ය දරුවන්ගේ ජාතික ඇඳුමින් සැරසීම උචිතය.)

XII. අදාළ අධියරයන් වලදී තරඟ පැවැත්වීමෙන් පසු ජයග්‍රහණය කළ තරඟකරුවන් පමණක් ඉදිරි තරඟ වලට ඉදිරිපත් කළ යුතුය. තරඟ අයිතමයන් සඳහා අවම වශයෙන් තරඟකරුවන් 5 දෙනෙකුවත් සිටිය යුතුය. (මෙය අදාල වන්නේ තනි තරඟ ඉසව් සඳහා පමණි.)

XIII. ජාතික තරඟයේදී ජයග්‍රාහී දරුවන් සඳහා මුල්‍යමය ත්‍යාග ඔවුන්ගේ බැංකු ගිණුම් වලට (සිසුරක / කැකුළු) බැර කිරීමට කටයුතු කෙරේ. ජාතික තරඟාවලිය අවසානයේදී අදාළ දිස්ත්‍රික්ක වෙත පහත සඳහන් අයුරින් මුදල් නිදහස් කරනු ඇත. ජාතික තරඟාවලියෙන් පසු ජයග්‍රාහි දරුවන්ගේ ත්‍යාග මුදල් දිස්ත්‍රික් සඳහා යොමු කරන අතර අදාළ දරුවන්ගේ ගිණුම් වලට එම ත්‍යාග මුදල් බැර වූ බවට ලිඛිතව ප්‍රධාන කාර්යාලය වෙත දැන්විය යුතුය. තවද දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරන දරුවන් සඳහා ත්‍යාග මුදල් ලබා දීමේදී පහත දි ඇති මුදල් සීමාවන් නොඉක්මවිය යුතු බව වැඩිදුරටත් දන්වමි.

| ස්ථානය | ඒකල | සමූහ |
|---|---|---|
| ප්‍රථම | 10,000/- | 40,000/- |
| දෙවන | 6,000/- | 30,000/- |
| තෙවන | 4,000/- | 20,000/- |
| කුසලතා (දෙකකි) | (එකකට) 1,500/- | (එකකට) 10,000/- |

XIV. තරඟ සදහා දරුවන් යොමු කිරීමේ දී සහ නිකුත් කරන ප්‍රතිඵල ව්‍යාජ හා වංචා සහගත නොවිය යුතු අතර එවැනි සිද්ධීන් වාර්තා වුවහොත් අදාළ නිළධාරින් සඳහා විනයානුකූල කටයුතු කිරීමට සිදුවන බව දන්වමි.

**ඇමුණුම 02**

**තරඟ විස්තර**

සියලු තරඟ ඇමුණුම 03 හා 04 හි දැක්වෙන අතර චිත්‍ර, ළමා කතන්දර, කෙටි නාට්‍ය, ගද්‍ය රචනා, පද්‍ය රචනා සඳහා විස්තර පහත පරිදි වේ.

**I.** චිත්‍ර තරඟය සඳහා 18 x 14 ප්‍රමාණයේ බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩ්‍රොවින් කඩදාසි භාවිතා කරන්න.

එළිය, අඳුර සහ ත්‍රිමාන ලක්ෂණ පිළිබිඹු වන අයුරින් චිත්‍ර සංරචනයක යොදවන්න. ප්‍රකාශන චිත්‍ර පමණක් නිර්මාණය කළ යුතු අතර මෝස්තර චිත්‍ර ඇදීම නොකළ යුතුය. **ප්ලැටිනම් හා කාබන් පෑන් භාවිතා නොකළ යුතුයි.**

II. බැංකු කලාප මට්ටමේදී ළමා කතන්දර තරඟය සඳහා පැය 5 ක කාලයක දී දරුවන්ට ස්වයං තේමාවක් මුලික කර ගත් නිර්මාණශීලී ළමා කතන්දරය ලිවීමට අවස්ථාවක් ලබා දය යුතුය. එහිදී තෝරාගනු ලබන නිර්මාණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදී හා දිස්ත්‍රික් හා ජාතික මට්ටම්වලදී ඉදිරිපත් කළ යුතු වේ. එසේ සකසන ලද කෘතියේ පසු පිටෙහි ලකුණු දීම සඳහා අදාළ ආකෘතියම භාවිතා කරන්න. (ඇමුණුම අංක - 06) ළමා කතන්දර කෘතිය නිර්මාණය කර භාර ගැනිමේදී එය, දරුවා විසින් තරඟයට සහභාගී වී නිර්මාණය කළ කෘතියක් බවට පරීක්ෂණ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

III. ළමා කතන්දර තරඟ ඉසව්ව සඳහා ජාතික මට්ටමේ දී දරුවන් ඉදිරිපත් නොකළ යුතු අතර දිස්ත්‍රික් තරඟාවලියේ දී ජයග්‍රහණය කළ දරුවන්ගේ **"ළමා කතන්දර නිර්මාණය"** පමණක් අදාළ දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර ඉදිරිපත් කිරීමට එසේ අපොහොසත් වන තරඟකරුවන්ගේ ළමා කතන්දර ජාතික තරඟාවලියේදී ප්‍රතික්ෂේප වනු ඇත. (දරුවෙක් තරඟය සඳහා ඉදිරිපත් කරන ළමා කතන්දර පොතේ තරඟකරුගේ නම, වයස් කාණ්ඩය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, හා දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතු වේ.)

IV. කෙටි නාට්‍ය තරඟ ඉසව්ව සඳහා අදාළ වන **ආධ්‍යාත්මික සංවර්ධනය / සාමාජීය වශයෙන් සමාජයට යහපත් පණිවිඩයක් ලබා දිය හැකි තේමාවක්** තෝරා ගත යුතු වේ.

V. ගද්‍ය හා පද්‍ය රචනා සඳහා ද පැය 1-2 ක කාලයක් දරුවන්ට ලබා දී සඳහන් කර ඇති මාතෘකා වලට අදාල වන පරිදි නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. තෝරාගනු ලබන දරුවන් ඒ ඒ අධියරයන් වලදී තරඟාවලියට සහභාගි කරවිය යුතුය.

<u>ඇමුණුම **03**</u>

<u>සිංහල මාධ්‍ය තරඟ ඉසව්</u>

| අනු අංකය | තරඟ ඉසව් | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | මව් / පිය ගුණ ගීතයක් ගායනා කළ යුතුය. |
| | | 11 - 14 | | |
| | | 15 - 18 | | |
| 02 | ශාස්ත්‍රීය ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | රාගය - කාෆි |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | රාගය - භීම්පලා ශ්‍රී |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය - බාගේ ශ්‍රී |
| 03 | ශාස්ත්‍රීය වාදනය | 11 - 14 | විනාඩි 4 - 6 | රාගය - භූපාලි |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය - දේශ්<br>තෝරා ගත් එක් වාද්‍ය භාණ්ඩයකින් පමණක් තරඟ කළ යුතුය. වයලීන්, සිතාර්, බටනලා, එස්රාජ් |
| 04 | ජන ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් ඉදිරිපත් කළ යුතුයි.<br>උදා:- 01. සී පද<br>02. ශාන්ති කර්ම<br>03. නෙළුම් ඔසේ<br>04. රබන් ගී<br>මෙයින් කැමති ජන ගායනා ශෛලීන් තුනකට අයත් කවි ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය. |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ජන නැටුම්<br>(සමූහ හෝ මිශ්‍ර)<br>(සාම්ප්‍රදායික ජන නැටුම් ආශ්‍රයෙන්) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 5 - 7 | නර්තනය - 12<br>අත්වැල් ගායනය - 04<br>(ළමා සමාජ දරුවන් විය යුතුයි. කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 16 ක් හා අවමය 10 විය යුතුයි.) |
| 06 | උඩරට - ඒකල (ගැහැණු/පිරිමි) | 11 - 14<br>15 - 18 | විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | සාම්ප්‍රදායික උඩරට නැටුම් සම්ප්‍රදායට අදාළ වන්නමක් විය යුතුයි. |
| 07 | පහතරට - ඒකල (ගැහැණු/පිරිමි) | 11 - 14<br>15 - 18 | විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | සාම්ප්‍රදායික පහතරට නැටුම් සම්ප්‍රදායට අදාළ වන්නමක් විය යුතුයි |
| 08 | කථික | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුයි. |
| 09 | නිවේදක (වැඩසටහනක් මෙහෙයවීම) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | කටහඬ / වචන උච්චාරණය / ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. |
| 10 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | පැස්ටල් / දිය සායම්<br>18 x 14 බ්‍රිසිල් බෝඩ් ඩ්‍රෝවින් කඩදාසි |
| 11 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථාංගයක් විය යුතුය.<br>ඒ 4 කොළ භාවිතා කරමින් නිර්මාණාත්මක පොත් පිංචක් ලෙස තරඟය පැවැත්වෙන අවස්ථාවේම සකස් කළ යුතුය. | 7 - 10<br>11 - 14<br>15 - 18 | උපරිම කාල සීමාව පැය 05 | වචන 100 - 150<br>වචන 250 - 300<br>වචන 300 - 500<br>ළමා කතන්දරයේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 12 | කෙටි නාට්‍ය (සමෘද්ධි වැඩසටහනට අදාළව) උදා:- ප්‍රචාරණ මාධ්‍යක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය. | විවෘත | විනාඩි 10 - 12 | නාට්‍ය සඳහා සහභාගී වන සියළුම ශිල්පීන් ළමා සමාජ දරුවන් විය යුතුයි. |
| 13 | ගද්‍ය රචනා | 7 - 10 | උපරිම කාලය පැය 02 යි. | වචන 100 |
| | | 11 - 14 | | වචන 250 |
| | | 15 - 18 | | වචන 350<br>පරිසරය සුරැකීමේ වැදගත්කම, පරිසරය සුරැකීම උදෙසා කාලීනව දරුවන් විසින් ඉටුකළ යුතු කාර්ය භාරය හා ස්වභාව සෞන්දර්යයේ අපූර්වත්වය විදහාපාන අයුරින් වන පරිදි මාතෘකා ලබාදී ගද්‍ය රචනා ගොඩනැගිය යුතුය.<br>ගද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |
| 14 | පද්‍ය රචනා | 7 - 10 | උපරිම කාලය පැය 02. | පේලි හතරේ පද පේලි 04 යි |
| | | 11 - 14 | | පේලි හතරේ පද පේලි 06 යි |
| | | 15 - 18 | | පේලි හතරේ පද පේලි 08 යි |
| | | | | පරිසරය සුරැකීමේ වැදගත්කම, පරිසරය සුරැකීම උදෙසා කාලීනව දරුවන් විසින් ඉටුකළ යුතු කාර්ය භාරය හා ස්වභාව සෞන්දර්යයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අපූර්වත්වය විදහාපාන අයුරින් වන පරිදි මාතෘකා ලබාදී පදා රචනා ගොඩනැගිය යුතුය. පදා රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |

**<u>ඇමුණුම 04</u>**

**<u>දමිළ මාධ්‍ය තරඟ ඉසව්</u>**

| අනු අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය | 7 - 10 | විනාඩි 3 - 5 | මව් / පිය ගුණ ගීතයක් ගායනා කළ යුතුය. |
| | | 11 - 14 | | |
| | | 15 - 18 | | |
| 02 | ජන ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් ඉදිරිපත් කළ යුතුයි. (ධීවර ගීත, ගොයම් ගී, ඔංචිලි වාරම් වැනි) |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | |
| 03 | ජන නැටුම් (සමූහ හෝ මිශ්‍ර) අම්මන් කුත්තු, කුරහන්, කාවඩි (කෝලාට්ටම් ශෛලීන් ආශ්‍රයෙන් නිර්මාණය කළ යුතුය.) | 7 - 10 | විනාඩි 6 - 8 | නර්තනය - 12<br>අත්වැල් ගායනය - 04<br>(ළමා සමාජ දරුවන් විය යුතුයි. කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 16 ක් හා අවමය 10 විය යුතුයි.) |
| | | 11 - 14 | | |
| | | 15 - 18 | | |
| 04 | නිවේදක | 7 - 10 | විනාඩි 3 - 5 | කටහඬ / වචන උච්චාරණය ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම. |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | |
| 05 | කථික | 7 - 10 | විනාඩි 3 - 5 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුය. |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | |

| | | | | |
|---|---|---|---|---|
| | | 15 - 18 | විනාඩි 5 - 7 | |
| 06 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | පැස්ටල් / දිය සායම් 18 x 14 බ්‍රිසිල් බෝඩ් ඩ්‍රෝවින් කඩදාසි |
| 07 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථාංගයක් විය යුතුය. ඒ 4 කොළ භාවිතා කරමින් පොත් පිංචක් ලෙස තරඟය පැවැත්වෙන අවස්ථාවේ සකස් කළ යුතුය. | 7 - 10<br>11 - 14<br>15 - 18 | උපරිම කාලය පැය 05 | වචන 100 - 150<br>වචන 250 - 300<br>වචන 300 - 500<br>ළමා කතන්දරයේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |
| 08 | කෙටි නාට්‍ය (පරිසරය හා සොබා දහමට අදාළව) උදා:- ප්‍රචාරණ මාධ්‍යයක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය. | විවෘත | විනාඩි 10 - 12 | නාට්‍ය සඳහා සහභාගී වන සියළුම ශිල්පීන් ළමා සමාජ දරුවන් විය යුතුයි. |
| 09 | ගද්‍ය රචනා | 7 - 10<br>11 - 14<br>15 - 18 | උපරිම කාලය පැය 02 | වචන 100<br>වචන 250<br>වචන 350<br>පරිසරය සුරැකීමේ වැදගත්කම, පරිසරය සුරැකීම උදෙසා කාලීනව දරුවන් විසින් ඉටුකළ යුතු කාර්ය භාරය හා ස්වභාව සෞන්දර්යයේ අපූර්වත්වය විදහාපාන අයුරින් වන පරිදි මාතෘකා ලබාදී ගද්‍ය රචනා ගොඩනැගිය යුතුය.<br>ගද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |
| 10 | පද්‍ය රචනා | 7 - 10 | උපරිම කාලය පැය 02 | පේළි හතරේ පද පේළි 04 යි |
| | | 11 - 14 | | පේළි හතරේ පද පේළි 06 යි |
| | | 15 - 18 | | පේළි හතරේ පද පේළි 08 යි |
| | | | | පරිසරය සුරැකීමේ වැදගත්කම, පරිසරය සුරැකීම උදෙසා කාලීනව දරුවන් විසින් ඉටුකළ යුතු කාර්ය භාරය හා ස්වභාව සෞන්දර්යයේ අපූර්වත්වය විදහාපාන අයුරින් වන පරිදි මාතෘකා ලබාදී පද්‍ය රචනා ගොඩනැගිය යුතුය.<br>පද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතුය. |

**<u>ඇමුණුම 05</u>**

**<u>කාල රාමුව, ක්‍රියාත්මක කිරීමේ වගකීම, අනුමත කිරීම හා ප්‍රතිපාදන</u>**

ඉහත දක්වා ඇති පරිදි සිංහල හා දමිළ මාධ්‍ය තරඟ බැංකු සංගම්, මට්ටමින් ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ඒ මට්ටම් වලදී අදාළ නිළධාරින් නියමාකාරයෙන් තරඟය පැවැත්වෙන බවට වගබලා ගත යුතුය.

| අදියර | ක්‍රියාත්මක කිරීමේ වගකීම, අනුමත කිරීම හා අධීක්ෂණය | පැවරෙන වගකීම | තරඟය පැවැත්විය යුතු කාලය |
|---|---|---|---|
| බැංකු සංගම් අදියර | වසමේ සමෘද්ධි සංවර්ධන නිළධාරි බැංකු සංගම් සමෘද්ධි කලාප කළමනාකරු<br>තරඟය පැවැත්වීමේදී අධීක්ෂණය - ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය | • සහභාගි වන තරඟ කරුවන් සඳහා බැංකු ගිණුම් ඇති බවට පරික්ෂා කිරීම වයස් කාණ්ඩය නිවැරදි බව පරික්ෂා කිරීම.<br>• උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම හා ජයග්‍රාහි නාම ලේඛන සකස් කිරීම | 2017 ජුනි 15 ට පෙර |

| | | | |
|---|---|---|---|
| | ලේකම්/කළමනාකාර අධ්‍යක්ෂ හෝ මූලස්ථාන කළමනාකරු | • තරඟ ප්‍රතිඵල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2017/06/20 දිනට පෙර ලබාදිය යුතුවේ. | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අධියර | සමාජ සංවර්ධන සහකාර, මූලස්ථාන කළමනාකරු / කළමනාකාර අධ්‍යක්ෂ / සහකාර ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය ලේකම්<br><br>තරඟය පැවැත්වීමේදී අධීක්ෂණය - දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂයට සම්බන්ධ වූ කළමණාකරුවන් | • බැංකු ගිණුම් , වයස නිවැරදි බවට උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම.<br>• කලාපයෙන් ලබාදුන් ජයග්‍රාහී නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාම ලේඛන අනුව තරඟාවලිය පැවැත්වීම.<br>• ජයග්‍රාහී නාම ලේඛනසකස් කිරීම.<br>• එම නාම ලේඛන දිස්ත්‍රික්කය වෙත 2017/08/05 දිනට පෙර ලබා දීම සම්බන්ධව වගකීම ගැනීම. | 2017 ජූලි 30 ට පෙර |
| දිස්ත්‍රික් අධියර | සමාජ සංවර්ධන විෂය කළමනාකරු, දිස්ත්‍රික් සමෘද්ධිඅධ්‍යක්ෂ<br>තරඟය පැවැත්වීමේදී අධීක්ෂණය-<br>සමාජ සංවර්ධන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ප්‍රධාන කාර්යාලයේ විෂයට සම්බන්ධ වූ කළමණාකරුවන් | • බැංකු ගිණුම්, උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම .<br>• ප්‍රාදේශීය කාර්යාලයෙන් ලබාදුන් ජයග්‍රාහී නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාම ලේඛන අනුව තරඟාවලිය පැවැත්වීම<br>• ජයග්‍රාහී නාම ලේඛන සකස් කිරීම.<br>• එම නාම ලේඛන ප්‍රධාන කාර්යාලය වෙත 2017/09/30 දිනට පෙර ලබා දිය යුතුවේ. | 2017 සැප්තැම්බර් 15 ට පෙර |
| ජාතික මට්ටම | අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන්<br>අධීක්ෂණය -<br>අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ(මානව සම්පත්), ප්‍රධාන ගණකාධිකාරි | දිස්ත්‍රික් සම්බන්ධීකරණය කරගනිමින් දමිළ හා සිංහල මාධ්‍ය ජාතික තරඟාවලිය නියමිත පරිදි පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීම. | 2017 ඔක්තෝබර් 30 ට පෙර |

| | | | |
|---|---|---|---|
| ජාතික උත්සවය | අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන් | ජාතික තරඟාවලියෙන් තෝරාගනු ලබන ජයග්‍රහකයින් ඇගයීම. | 2017 දෙසැම්බර් |

මෙම තරඟාවලිය පැවැත්වෙන කාල සීමාවන් තුළදී ඉහත පරිදි අදාල නිළධාරීන් වගකීම් දැරීම අනිවාර්ය වන අතර අදාළ තරඟාවලි පැවැත්වෙන දිනවලදී සඳහන් කර ඇති පරිදි අධීක්ෂණ කටයුතු සඳහා නිළධාරි නියෝජනයක් සහභාගි කරවීම සුදුසු වේ.

I. දිස්ත්‍රික් මට්ටම දක්වා තරඟ පැවැත්වීමෙන් අනතුරුව ඒ ඒ තරඟ ඉසව්වලින් අදාළ වයස් කාණ්ඩ වලින් ප්‍රථම ස්ථානය දිනා ගත් දරුවන් ජාතික තරඟය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

II. ඉහත කාල පරිච්ඡේදයට අනුව තරඟාවලියේ අදාළ මට්ටම් නිම කළ යුතු අතර දිස්ත්‍රික් තරඟයේ තරඟ ප්‍රතිඵල 2017.09.30 වන දිනට ප්‍රථම දී ඇති ආකෘතියට අනුව පැහැදිලිව සකස් කර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතුය.

III. ජාතික තරඟය සඳහා නාමලේඛන ඉදිරිපත් කිරීමේදී තරඟකරුවන්ගේ නම් නිවැරදිව සටහන් කර එවීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. දරුවන්ගේ නම් වල මුලකුරු ඉංග්‍රීසි අක්ෂර වලින් සටහන් කළ යුතුය. දමිළ මාධ්‍ය දරුවන්ගේ සම්පූර්ණ නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හා දමිළ මාධ්‍යයෙන් එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. **<u>(පහත ආකෘතිය භාවිතා කරමින් පමණක් අදාළ තරඟ ප්‍රථිඵල එවීමට කටයුතු කරන මෙන් අවධාරණය කරන අතර මින් පරිබාහිරව එන කිසිදු ප්‍රථිඵල ලේඛනයක් බාර නොගන්නා බව වැඩිදුරටත් දන්වමි.)</u>**

| අනු අංකය | දිස්ත්‍රික් කය | ප්‍රා / ලේ / කොට්ඨාශය | ළමා සමාජයේ නම | දරුවා නමින් ළමා ගිණුම ක්‍රියාත්මක සමෘද්ධි බැංකුවේ නම හා ගිණුම් අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | තරඟකරුගේ නම | උපන් දිනය | ලබා ගත් ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකල තරඟ සඳහා | | | | | | | | | |
| 01 | ගම්පහ | මහර | සමෘ/ළමා/ගම්/මහ/01 | 1801/03/30/01 | කථික | 7 - 11 | ඒ.ඩී.ඉෂිනි භාෂිකා කොතලාවල | | ප්‍රථම |
| සමූහ තරඟ සඳහා | | | | | | | | | |
| 02 | මාතර | මාතර | සමෘ/ළමා/මාත/මාත/01 | 1801/03/30/01 | ජන නැටුම් (සමූහ / මිශ්‍ර) | 15 - 18 | ඒ.ඩී.නයනා අනුත්තරා පෙරේරා | | ප්‍රථම |
| | | | | | | | අත්වැල් ගායනා සඳහා නම් ද මේ අයුරින් 1 - 16 දක්වා නිවැරදිව සටහන් කරන්න. | | |

**<u>විනිශ්චය මණ්ඩලය තෝරා ගැනීම හා අනුමත කිරීම</u>**

බැංකු සංගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටම්වලදී තරඟ අංශ විනිශ්චය කිරීම සඳහා ඒ ඒ විෂයන් පිළිබඳ නිපුණතාවයකින් යුතු නිළධාරීන් පත් කර ගත යුතු අතර එසේ පත් කර ගන්නා විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කළ යුතු වේ.

**<u>ප්‍රතිපාදන</u>**

එක් මාධ්‍යයක තරඟ පැවැත්වීම සඳහා බැංකු සංගම් මට්ටමේදී උපරිම රු.10,000/- ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තරඟ සඳහා රු. 20,000/- ක උපරිමයකට යටත්ව ද බැනර් ප්‍රදර්ශනය සඳහා එක් බැනරයකට උපරිම රු.1000/- ක් වන පරිදි ද අදාළ සමාජ සංවර්ධන පදනමින් වියදම් දැරීමට අනුමැතිය ලබා දෙමි. දිස්ත්‍රික් තරඟ සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට උපරිම රු.10,000/- ක් බැගින් වන පරිදි ප්‍රධාන කාර්යලය මගින් දිස්ත්‍රික්කය වෙත ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ.

**ඇමුණුම 06**

**ළමා කතන්දර ලකුණු සටහන් කිරීම (කලාප මට්ටමේ සිට)**

සකස් කරන ලද ළමා කතන්දර පොතෙහි ලකුණු සටහන් කිරීමේ ආකෘතිය අමුණන්න.

| අනු අංකය | විනිශ්චය මණ්ඩලයේ නම | කලාප තරඟ | | | | | | විනිශ්චය මණ්ඩලයේ අත්සන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | අන්තර්ගතය | භාෂාව | නිර්මාණාත්මක බව | ඉදිරිපත් කිරීම | පරිකල්පනය | මුළු ලකුණු | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |

| අනු අංකය | විනිශ්චය මණ්ඩලයේ නම | ප්‍රාදේශීය තරඟ | | | | | | විනිශ්චය මණ්ඩලයේ අත්සන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | අන්තර්ගතය | භාෂාව | නිර්මාණාත්මක බව | ඉදිරිපත් කිරීම | පරිකල්පනය | මුළු ලකුණු | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |

| අනු අංකය | විනිශ්චය මණ්ඩලයේ නම | දිස්ත්‍රික් තරඟ | | | | | | විනිශ්චය මණ්ඩලයේ අත්සන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | අන්තර්ගතය | භාෂාව | නිර්මාණාත්මක බව | ඉදිරිපත් කිරීම | පරිකල්පනය | මුළු ලකුණු | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |

| අනු අංකය | විනිශ්චය මණ්ඩලයේ නම | ජාතික තරඟ | | | | | | විනිශ්චය මණ්ඩලයේ අත්සන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | අන්තර්ගතය | භාෂාව | නිර්මාණාත්මක බව | ඉදිරිපත් කිරීම | පරිකල්පනය | මුළු ලකුණු | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |